# ජ්‍යාමිතික වියුක්ත චිත්‍ර තරගය - 2025

## (Geometric Abstract Arts Competition – 2025)

හිතවත් ශිෂ්‍ය ශිෂ්‍යාවනි, ගණිතයේ සුන්දරත්වය ගවේෂණය කරමින්, සීමාවෙන් ඔබ්බට පරිකල්පනයෙන් බල ගැන්වෙන ජ්‍යාමිතික වියුක්ත චිත්‍රයක් නිර්මාණය කර එය අප වෙත එවන්න, එවිට අපට ඔබේ නිර්මාණශීලී කුසලතාවය ඇගයීමට හැකිවේ. ජ්‍යාමිතික වියුක්ත චිත්‍ර තරගය මඟින් ඔබ විසින් නිර්මාණය කරන ලද ඉතාමත් අලංකාර සහ අර්ථවත් චිත්‍ර සඳහා මුදල් ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානය කිරීමට අප සූදානම්,

**තරගයේ කොන්දේසි ;**

1. ශ්‍රී ලංකාවේ පදිංචි සිසුන්ට පමණක් සහභාගී විය හැකි අතර එක් සිසුවෙකුට අඟල් 14 × අඟල් 18 ප්‍රමාණයේ එක් චිත්‍රයක් පමණක් ඉදිරිපත් කිරීමට සුදුසුකම ඇත.

2. ඇලෙන සුලු, වියළීම අපහසු තීන්ත වර්ග හැර ඕනෑම කැමති මාධ්‍යයක් භාවිත කළ හැක. විවිධ වර්ණ ඡායා යොදා ගනිමින් වෘත්ත, ත්‍රිකෝණ, ඍජුකෝණාස්‍ර සහ සරල රේඛා වැනි ජ්‍යාමිතික හැඩතල පමණක් ඔබගේ නිර්මාණ සඳහා භාවිත කළ යුතු ය.

3. ඉදිරිපත් කරන ලද චිත්‍රයක් අවසන් වටයට තෝරාගනු ලැබුවහොත්, අප විසින් කරන දැනුම්දීමකින් පසුව අයිතිය තහවුරු කර ගැනීම පිණිස ඔබ විසින් ඔබේ විදුහල්පතිවරයාගේ, උප විදුහල්පතිවරයාගේ සහතිකයක් සමඟින් මුල් චිත්‍රය අප වෙත එවිය යුතු ය.

4. චිත්‍රය ඔබ විසින් කල මුල් නිර්මාණයක් විය යුතුය. එය වෙනත් තරඟයකට ඉදිරිපත් නොකළ යුතු අතර ඔබ එය ප්‍රතිනිර්මාණය කිරීම හෝ වෙනත් අයෙකුට නිර්මාණය කිරීමට ලබා දීම නොකළ යුතු ය.

5. තරගයට ඉදිරිපත් කරන සියලු ම චිත්‍රවල ප්‍රකාශන අයිතිය **BRAINSTORMER FOUNDATION** සතු වන අතර ආපසු ලබා නොදෙනු ඇත.

6. ජයග්‍රාහකයින් ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් විසින් තීරණය කරනු ලබන අතර විනිශ්චයකරුවන්ගේ තීරණය අවසාන තීරණය වේ.

**ඔබේ චිත්‍ර එවිය යුතු ආකාරය;**

• තරගයට ඇතුළත් වීමට, 2025 පෙබරවාරි 14 වන දින වන විට, අදාළ විස්තර සමඟ, http://www.brainstormermath.org/competition වෙබ් අඩවියට (JPEG ආකෘතියෙන්, 5MB ට නොවැඩි) ස්කෑන් කරන ලද ඔබගේ චිත්‍රය උඩුගත ( upload) කරන්න.

• පහත විස්තර වෙබ් අඩවියේ පිරවිය යුතුය - තරගකරුගේ සම්පූර්ණ නම, තරගකරුගේ උපන් දිනය, ලිපිනය, පාසල සහ එහි ලිපිනය, මවගේ / පියාගේ / භාරකරුගේ නම, ඊමේල් ලිපිනය සහ දුරකථන (ජංගම).

**ත්‍යාග සහ සහතික;**

• 1, 2, සහ 3 වැනි ස්ථාන සඳහා පිළිවෙළින් රු. 50,000 , රු. 30,000, රු. 20,000 සහ සහතිකපත් .

• විශිෂ්ටතා සම්මානලාභීන් 25 දෙනෙකුට සහතිකපත් පිරිනැමෙන අතර කුසලතා සහතික 50 දෙනෙකුට ද ප්‍රදානය කෙරේ.

• සම්මාන උළෙල 2025 මාර්තු 14 වැනි දින **කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී** පැවැත් වේ.

සියලුම මුදල් ත්‍යාග කොමර්ෂල් බැංකුවේ ජයග්‍රාහකයාගේ ඉතුරුම් ගිණුම් වෙත බැර කෙරේ. වැඩි විස්තර සඳහා අපගේ වෙබ් අඩවිය http://www.brainstormermath.org වෙත පිවිසෙන්න, නැතහොත් brainstormer.npo@gmail.com හෝ 0778011622 මඟින් විමසන්න.

මෙම තරගය අධ්‍යාපන අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය සහිතව **BRAINSTORMER FOUNDATION** මඟින් ජාත්‍යන්තර ගණිත දිනය සැමරීම පිණිස දීප ව්‍යාප්තව සංවිධානය කරනු ලබන්නකි.